# ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ඇගයීමක්

කේ.ඒ.පී.එන්. කහඳවල[1] ඊ.ඩබ්.ඒ.කේ. සඳමාලි[2]
එල්. ඊශරා කුමාරි[3] ඩබ්.එන්.ඩී.එන්. ප්‍රේමතිලක[4]
කේ.ටී.සී.එම්. රත්නසේකර[5] එම්.කේ. නදීකා දමයන්ති[6]

## සංක්ෂේපය

සංකීර්ණ සහ අසීමිත මිනිස් අවශ්‍යතා සීමිත සම්පත් තුළින් පරිපූර්ණ කර ගැනීමට උත්සාහ දැරීමේ එක් භයානක ප්‍රතිඵලයක් වන්නේ ලෝකය පුරා ජීවත් වන ජනතාවට විවිධ ආකාරයේ ස්වාභාවික ආපදාවන්ට මුහුණ පෑමට සිදුවීමයි. එවැනි හදිසි ආපදා මනා ලෙස කළමනාකරණය කර ගැනීම සඳහා නූතන මිනිසා විසින් අතීත අත්දැකීම් සමග සසඳා ගොඩ නගන ලද ක්‍රියාකාරකම් නූතනයේ ආපදා කළමනාකරණය ලෙසින් හැඳින්වේ.විවිධ මට්ටමේ ස්වාභාවික ආපදාවන්ට ශ්‍රී ලංකාව නිරන්තරයෙන් මුහුණ පෑම සිදුවේ. 2004 වර්ෂය වන තුරු ශ්‍රී ලංකාවට විධිමත් මට්ටමේ ආපදා කළමනාකරණ ප්‍රතිපත්තියක් නොවීම නිසා 2004 සුනාමි ව්‍යසනයෙන් විපතට පත්වූවන් නැවත පදිංචි කිරීම හා ඔවුන්ගේ සමාජ, ආර්ථික තත්ත්ව නැවත ගොඩ නැගීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් නොවුණි. නමුත් 2010 වර්ෂයේ ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය හඳුන්වාදීමත් සමග ආපදාවක් ඇති වූ වහාම රාජ්‍ය යාන්ත්‍රණය මඟින් ඒ සඳහා ප්‍රතිකර්ම යෙදිය යුතු ආකාරයත් සමානාත්මතාවයෙන් හා වගකීම් සහගත අයුරින් ජනතාවට සහන සැලසිය යුතු ආකාරය පිළිබඳවත් විධිමත් වැඩපිළිවෙලක් මෙරට තුළ සකස් විය. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන ආකාරයත් සහ එම ප්‍රතිපත්තියේ පවතින දුර්වලතා හඳුනා ගැනීමත්ය. ඒ අනුව ගංවතුර ආපදාවට නිරන්තරයෙන් ගොදුරු වන බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මාබිම බටහිර ග්‍රාම නිලධාරී වසම ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබූ අතර අධ්‍යයන නියැදිය අහඹු ලෙස තෝරාගත් පවුල් 20කින් යුක්ත විය. අධ්‍යයනයේදී ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා මඟින් ප්‍රාථමික දත්ත සහ තොරතුරු සපයා ගැනිණි. අධ්‍යයනයෙන් අනාවරණය වූ අන්දමට ප්‍රතිචාරීන්ගෙන් 90%ක් එම බිම්වල පදිංචිවීමට ප්‍රථම එම ප්‍රදේශය ගංවතුර අවධානමක් ඇති ප්‍රදේශයක් බව දැනුවත්ව සිට ඇති අතර ගංවතුර හේතුවෙන් ඔවුන්ට කුමන හෝ ආකාරයක හානියක් සිදුව ඇති බවයි. එමෙන්ම ප්‍රතිචාරීන්ගෙන් 95% අනාවරණය කරනු ලැබුවේ ගංවතුර තත්ත්වයෙන් පසු ඇතිවන

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[2] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[3] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[4] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[5] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[6] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. damayanthi@kln.ac.lk

සෞඛ්‍ය අවදානම් අවම කරගැනීමට කිසිදු ආයතනයක් හෝ නිලධාරියෙක් තමන්ට සහායක් ලබා නොදුන් බවයි. ආපදා අවස්ථාවකදී රාජ්‍ය අංශය වෙතින් සපයන සේවා සම්බන්ධයෙන් ප්‍රතිචාරින්ගෙන් 55% අතෘප්තිමත් හෝ ඉතා අතෘප්තිමත්ය. ප්‍රදේශයේ ගංවතුර ආපදා තත්ත්වයක් ඇතිවිමට හේතු වන්නේ ඇල මාර්ග ප්‍රතිසංස්කරණය නොකිරීම, පහත් බිම් සහ ඇල මාර්ග ගොඩකිරීමයි. අධ්‍යයනයේ නිගමනය වන්නේ ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් වන ජාතික ප්‍රතිපත්තිය අපේක්ෂිත මට්ටමේ සාර්ථක භාවයකින් යුතුව ක්‍රියාත්මක නොවන බවයි.

**මුඛ්‍ය පද ඃ** *ආපදා කළමනාකරණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ගංවතුර උවදුර, රාජ්‍ය අංශය, ගම්පහ දිස්ත්‍රික්කය*